# 2024

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT



**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**
**வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம்**
**DEPARTMENT OF WILDLIFE CONSERVATION**

**පරිසර අමාත්‍යාංශය**
**சுற்றாடல் அமைச்சு**
**MINISTRY OF ENVIRONMENT**

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# 2024

## කාර්යසාධන වාර්තාව

811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

## පටුන


අ/අ **පරිච්ඡේදය 01**

**ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය** **1-10**

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

1.3 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ, ඒවායේ කාර්යභාරය හා ප්‍රාදේශීය කාර්යාල හා දායකවන අන්තර්ජාතික සම්මුතීන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

**පරිච්ඡේදය 02**

**ප්‍රගතිය හා ඉදිරි දැක්ම** **11 -35**

2.1 මූල්‍ය ප්‍රගතිය සාරාංශය

2.2 ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය

2.3 ඒකාබද්ධ අරමුදල හා වනසත්ත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි භෞතික ප්‍රගතිය

2.4 2024 වසරේදී දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද සුවිශේෂී සේවාවන්

2.5 දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග

**පරිච්ඡේදය 03**

**වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය** **36-61**

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.7 මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.9 විගණකාධිපතිගේ වාර්තාව

**පරිච්ඡේදය 04**

**කාර්යසාධන දර්ශක** **62**

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

**පරිච්ඡේදය 05**

**තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය** 63-65

5.1 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14,15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**පරිච්ඡේදය 06**

**මානව සම්පත් පැතිකඩ** 66-71

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

6.3 **මානව සම්පත් සංවර්ධනය**

**පරිච්ඡේදය 07** 72-81

7.1 අනුකූලතා වාර්තාව

## පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය ශාක හා සත්ත්ව ප්‍රජාවන් සංරක්ෂණය කිරීම ජාතික වශයෙන් ප්‍රමුඛ අවශ්‍යතාවයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරය ඇතුළු දේශසීමාව තුළ වනජීවී සම්පත් දිගු කාලීනව ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඒ සඳහා වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයක් ස්ථාපිත කර කළමනාකරණය කිරීමේ නීතිමය වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර එසේ ස්ථාපිත කරන ලද රක්ෂිත භූමි (සමුද්‍රීය සහ ගොඩබිම රක්ෂිත ) ප්‍රමාණයේ මුළු එකතුව වර්ග කි.මී 12,500 ක් පමණ වේ. එය ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 18.9 % ක් පමණ වේ. මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ජාතික රක්ෂිත 39 ක්ද අභයභූමි 69 ක් ද අලි කළමනාකරණ රක්ෂිත 01 ක් ද ලෙස වනජීවී රක්ෂිත 109 ක් ප්‍රකාශයට පත්කර ඇත.

මෙම රක්ෂිත ප්‍රදේශ ජාලය විහිදී ඇති ආකාරය පහත දක්වා ඇත.

| රක්ෂිත ප්‍රදේශ වර්ගය | | දැනට ප්‍රකාශයට පත්කර ඇති සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික රක්ෂිත | දැඩි ස්වභාව රක්ෂිත | 03 |
| | ජාතික උද්‍යාන | 26 |
| | ස්වභාව රක්ෂිත | 09 |
| | වන පිවිසුම් | 01 |
| **එකතුව** | | 39 |
| අභයභූමි | | 69 |
| අලි කළමනාකරණ රක්ෂිත | | 01 |
| **මුළු එකතුව** | | 109 |

වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ වනජීවී රක්ෂිතවලින් බැහැර පෙදෙස් වල වනජීවී සම්පත් ආරක්ෂා කිරීම සඳහා අදාල නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය නීතිමය බලයද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

විවිධත්වයෙන් පොහොසත් මෙරට ජෛව සම්පත් ඒවායේ ස්වභාවික වාසස්ථාන සමඟ සංරක්ෂණය කිරීමට අමතර වශයෙන් වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය ශ්‍රී ලංකාව තුළ පවත්නා කෘෂි කර්මාන්තයට සහ විදුලි බල නිෂ්පාදනයට වැදගත් වන විශාල ප්‍රමාණයේ ජලාශ සහ ඒවායේ පෝෂක ප්‍රදේශවල ද දිගු කාලීන ආරක්ෂාව තහවුරු කරයි. සේනානායක සමුද්‍රය ඇතුළු ගල්ඔය නිම්නයේ ජලාශ, බොහෝ

මහවැලි ජලාශ, මධ්‍යම සහ උතුරු මැද පළාත්වල පිහිටි මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා ජලාශ, උඩවලව, මව්ආර, ලුණුගම්වෙහෙර සහ වෙහෙරගල යනාදී මෙරට දකුණු ප්‍රදේශයේ පවත්නා ජලාශ, වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ පිහිටයි. තවද, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, පදවිය, කලාවැව සහ යෝධ වැව වැනි ප්‍රධාන වැව් රාශියකද ජල පෝෂක ප්‍රදේශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ලෙස සංරක්ෂණයට ලක්කර ඇත. මෙසේ වනජීවී රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටන කෘෂි කර්මාන්තය සහ ජල විදුලිය නිෂ්පාදනය සඳහා වැදගත් වන ජලාශ සංඛ්‍යාව 40 ඉක්මවයි. තවද මහවැලි, කැළණි, කළු සහ වලවේ යන ප්‍රධාන ගංගාවල්වල ඉහළ ජල පෝෂක ප්‍රදේශ ද පිහිටා ඇත්තේ ශ්‍රී පාද අඩවිය ස්වභාව රක්ෂිතය, හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය වැනි වනජීවී රක්ෂිත තුළය.
එමෙන්ම ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසර ආශ්‍රිතව සංචාරක කර්මාන්තයේ ප්‍රධාන විභවයක් වන්නේ ද වනජීවී රක්ෂිත තුළ පවතින වනජීවී සම්පත් වන අතර වනජීවී රක්ෂිත ආශ්‍රිත  සංචාරක කර්මාන්තය තුළින් 2024  වර්ෂය තුළ ලබා ඇති ආදායම රුපියල් මිලියන 8,815,08 ක් පමණ වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම :** වර්තමාන සහ අනාගත පරපුර උදෙසා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම.

**මෙහෙවර :** සහභාගීත්ව කළමනාකරණය මඟින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම.

**අරමුණු :**

- ජාතික හා අන්තර් ජාතික ප්‍රතිපත්තීන් හා ගැලපෙන අයුරින් වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා උපාය මාර්ගික ජාතික සැලසුම් සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- සුවිශේෂී විද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන සහිතව රට තුළ පවත්නා සියලුම ස්වභාවික පරිසර පද්ධතීන්  නියෝජනය වන පරිදි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම ඒවා කාලානුරූපව සහ වනජීවී විශේෂවල ධරණීය ගහන පවත්වාගෙන යා හැකි ආකාරයට සංඛ්‍යාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ ඒවා අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම.
- වඩාත් සුදුසු පර්යේෂණ දත්ත හා තොරතුරු මත පදනම්ව රක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා කළමනාකරණය කිරීම සහ ඒවායේ තත්ත්වයන් යාවත්කාලීන කිරීම හා සුපරීක්ෂාව.
- අන්තරායට ලක් වූ විශේෂ සඳහා සංරක්ෂණ සැළසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- අදාළ රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් සැපයීම.
- රට තුළ වනජීවී සම්පත්  නීතිවිරෝධී ලෙස භාවිතයන් අවම කිරීම සඳහා වනසත්ත්ව  හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ වෙනත් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් කළමනාකරණයට අදාළ වන විද්‍යාත්මක පර්යේෂණ දිරිගැන්වීම.

- පුහුණු කිරීම්, දිරිගැන්වීම සහ අභිප්‍රේරණය මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.
- අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීම.
- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම මගින් සංරක්ෂණය සඳහා එකී ප්‍රජාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම.

## 1.3 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල හා ඒවායේ ප්‍රධාන කාර්යයන්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අංශ 10 ක් හා ප්‍රාදේශීය වනජීවී කාර්යාල ස්ථාපිත කර ඇත. ප්‍රධාන කාර්යාලයේ අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන කාර්යයන් හා වගකීම් පිළිබඳ විස්තර පහත වේ.

**ක්ෂේත්‍ර ගත කාර්යාල**

| **කාර්යාල කාණ්ඩය** | **දැනට ස්ථාපිත කර ඇති සංඛ්‍යාව** |
|---|---|
| කලාප කාර්යාල | 13 |
| කලාප පශු වෛද්‍ය ඒකක | 08 |
| පශු වෛද්‍ය රෝහල් | 01 |
| උඩවලව ඇත් අතුරු සෙවණ | 01 |
| උඩවලව අලි රුඳවුම් මධ්‍යස්ථානය | 01 |
| වනඅලි පාලන ඒකක | 04 |
| ජාතික උද්‍යාන මූලස්ථාන | 17 |
| පුහුණු මධ්‍යස්ථාන | 03 |
| වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලය | 74 |
| වනජීවී බීට්ටු කාර්යාලය | 85 |

### 1.3.1 ප්‍රධාන කාර්යාලයේ අංශ

#### 1.3.1.1 සැළසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- දෙපාර්තමේන්තුවේ මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික වාර්තා, වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lk වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- දීපව්‍යාප්ත රේඩියෝ සන්නිවේදන පද්ධතිය හා අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය නඩත්තුව, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත පරිගණක ජාලය කළමනාකරණය, නඩත්තුව හා වැඩිදියුණු කිරීම.
- ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම හා GIS ඒකකය කළමනාකරණය කිරීම.

#### 1.3.1.2 ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය

- රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සහ සංශෝධනය.
- සම්පත් වට්ටෝරු පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
- රක්ෂිත ප්‍රදේශ ජාලය විමර්ශනය කිරීම, ප්‍රකාශයට පත්කිරීම, මායිම් මිණුම් කිරීම සහ සලකුණු කිරීම.
- වනජීවී වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ පසුවිපරම් කිරීම.
- ආක්‍රමණශීලි ශාක සඳහා විශේෂ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ගිනිපටි සහ වනජීවී වාසස්ථාන වල සංඝටක කළමනාකරණය.
- පරිසර දූෂණය පාලනය සහ වනජීවී විශේෂ ආරක්ෂා කිරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය.
- රක්ෂිත ප්‍රදේශ තුළ යෝජිත සංවර්ධන කටයුතු සඳහා හා රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම.

#### 1.3.1.3 සමුද්‍ර ඒකකය

- සමුද්‍ර වනජීවී රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිලියෙළ කිරීම
- සමුද්‍ර රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය , ජීවීන් සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි , චක්‍රලේඛ, සැලසුම් පිළියළෙ කර නිකුත් කිරීම
- සමුද්‍ර ජීවීන් සහ සමුද්‍ර පරිසර පද්ධති සංරක්ෂණය සඳහා වූ කමිටුව ස්ථාපිත කර පවත්වාගෙන යාම.

- සමුද්‍ර සංරක්ෂණයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , පුහුණු පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ප්‍රදර්ශනකුටි පැවැත්වීම.
- සමුද්‍ර සංරක්ෂණයට අදාලව පර්යේෂණ සිදු කිරීම සහ පර්යේෂණ ලිපි පළ කිරීම
- සමුද්‍ර සංරක්ෂණයට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාකාරකම් සිදුකිරීම

### 1.3.1.4 නීති ක්‍රියාත්මක කිරීම් අංශය

- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම හා අදාළ රාජකාරී සඳහා දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අවශ්‍ය සහාය ලබාදීම හා පනත යටතේ සිදු කළ යුතු ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර නිකුත් කිරිමේ කටයුතු සිදු කිරීම.
- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ අවශ්‍ය සංශෝධන සිදුකිරීම සහ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි පිළියෙල කිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුව හා නීතිය ක්‍රියාත්මක කිරීමට ආදාළ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- CITES සම්මුතිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම.

### 1.3.1.5 අලි සංරක්ෂණ අංශය

- ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වනඅලි සම්බන්ධ දත්ත හා තොරතුරු එකතුව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- වනඅලි පිවිසුම් ප්‍රදේශ හා පිවිසුම් ආරක්ෂා වන පරිදි වනඅලි සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.
- වනඅලි හානි සඳහා වන්දි ගෙවීම.
- ජනාවාස තුළට වනඅලින්ගේ පිවිසීම බාධක වන පරිදි විදුලි වැට, ජීවවැට සහ වෙනත් නවීන ක්‍රමවේද මඟින් භෞතික බාධක ස්ථාපිත කිරීම.
- වනඅලි කළමනාකරණය හා ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම.

### 1.3.1.6 පර්යේෂණ හා පුහුණු අංශය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීමේ හා හා පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සහ විවිධ බාහිර පාර්ශ්වයන් මඟින් සිදුකරන පර්යේෂණවලට අදාළ උපදෙස් සහ අනුමැතිය ලබාදීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා නිලධාරීන් යොමුකිරීමට කටයුතු කිරීම.
- පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.
- ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රයේ කටයුතු අධීක්ෂණය කර එම කටයුතු පවත්වාගෙන යාම.

- වනජීවී රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව සිදුකරන රූගත කිරීම් වලට අදාලව කොන්දේසීන්ට යටත්ව අවසර ලබා දීම
- දෙපාර්තමේන්තු ප්‍රචාරක සහ මාධ්‍ය වැඩසටහන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම.

1.3.1.6.1 ප්‍රචාරක අංශය

- වනජීවී සංරක්ෂණය පිළිබඳව මහජනතාව දැනුවත් වන ආකාරයේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් සංස්කරණය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.
- මාධ්‍ය වැඩමුළු, මාධ්‍ය චාරිකා සංවිධානය කර වනජීවී සංරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීම.
- වනජීවී සංරක්ෂණයට අදාලව ජාත්‍යන්තරව ප්‍රකාශයට පත්කරන ලද දිනයන් වෙනුවෙන් සංරක්ෂණ වැඩසටහන් දියත් කිරීම .(ලෝක තෙත්බිම් දිනය,ලෝක වනජීවී දිනය,පරිසර දිනය).
- දෙපාර්තමේන්තුවේ නිල ප්‍රකාශය වන "ශ්‍රී ලංකා වනජීවී" සඟරාව සංස්කරණය කර ප්‍රකාශයට පත්කිරීම.
- වනජීවී සංරක්ෂණය පිළිබඳව මහජනතාව,පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා මාසික ප්‍රකාශන (වනජීවී විත්ති) ,අත්පත්‍රිකා,පෝස්ටර් සහ අත්පොත් සංස්කරණය කර මුද්‍රණය කිරීම.
- වනජීවී සංරක්ෂණය පිළිබඳව උනන්දුවක් දක්වන්නන් සඳහා වනජීවී ක්ෂේත්‍රයට අදාලව මාසිකව මහජන දේශන මාලාවක් "Public Talk" මැයෙන් ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වීම.
- වනජීවී සංරක්ෂණය දෙපාර්තමේන්තුවට අදාල කාලීන ප්‍රවෘත්ති ,තොරතුරු සහ ප්‍රවෘත්ති නිවේදන මාධ්‍ය වෙත නිකුත් කිරීම.

### 1.3.1.7 සංචාරක සේවා කළමනාකරණ පාරිසරික සංචාරක හා ජනවිඥිදූම්කරණ අංශය

- සංචාරක සේවා සැළසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, නව සංචාරක පැකේජ හඳුන්වාදීම
- සංචාරක කටයුතු විවිධාංගීකරණය.
- පාරිසරික සංචාරක සේවා අලෙවිකරණය සහ ප්‍රවර්ධනය.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ ඒ ආශ්‍රිතව සංචාරක සේවා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මත අවට ප්‍රජාවගේ යැපීම අඩු කිරීම සඳහා එම ප්‍රජාවන් රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දායකකර ගැනීම.
- අධ්‍යාපනික සහ ව්‍යාප්ති වැඩසටහන් මඟින් මහජනතාව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම.

### 1.3.1.8 වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය

- වන සත්ත්ව වසංගත රෝග පාලනය සිදු කිරීම
- වන සතුන්ගේ සෞඛ්‍ය කළමනාකරණය
- සත්ත්ව රෝග ආවේක්ෂණය, නිශ්චය කිරීම, පාලන ක්‍රමවේද නිර්ණය හා වාර්තාකරණය
- වන සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීම හා වාර්තාකරණය

- පශු පර්යේෂණ කටයුතු හා විමර්ශන කටයුතුවලට දායකත්වය දැක්වීම
- වන සත්ත්ව සුබසාධන කළමනාකරණය සහ ගුණාත්මක බව වර්ධනය කිරීම හා වන සත්ත්ව මිනිස් ගැටුම් කළමනාකරණය
- වනජීවී සෞඛ්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන හා ඇත් අතුරු සෙවන සම්බන්ධ පාලන අධිකාරිය පවත්වා ගැනීම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදනවලට අනුකූලව අවශ්‍ය සහතික නිකුත් කිරීම, අවශ්‍ය අවස්ථාවලදී අධිකරණ ක්‍රියාවලිය සඳහා විශේෂඥ වාර්තා සහ සාක්ෂි ඉදිරිපත් කිරීම
- අනතුරට පත් වූ / අවතැන් වූ වන සතුන් මුදා ගැනීම, පුනරුත්ථාපනය කිරීම, නැවත වනගත කිරීමේ මෙහෙයුම් සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන One Health වැඩසටහන සඳහා ක්‍රියාකාරී දායකත්වය සැපයීම
- අන්තර්ජාතික දේශීය නොවන (Exotic) සත්ත්ව විශේෂ ආනයනය හා සම්බන්ධ නීතිමය අවසර සැපයීමේදී සත්ත්ව සෞඛ්‍ය, සුබසාධනය සහ රෝග සම්බන්ධ තාක්ෂණික උපදේශනය

### 1.3.1.9 ඉංජිනේරු අංශය

- රක්ෂිත ප්‍රදේශ තුළ භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමේ සහ ඉදිකිරීම් සැළසුම් ක්‍රියාත්මක කිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ අවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැඟිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා මාර්ග පද්ධතිය නඩත්තුව සහ ඉදිකිරීම.

### 1.3.1.10 මානව සම්පත් සංවර්ධන අංශය

- මානව සම්පත් සහ සාමාන්‍ය පරිපාලන සැළසුම් පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම, උසස් කිරීම, පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයට අදාල ස්ථානමාරු , විනය කටයුතු ,සේවා දීර්ඝ, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාම වැටුප් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදල් පිළිබඳ කටයුතු සිදුකිරීම.
- නිලධාරීන්ගේ කාර්ය සාධන කටයුතු , වැටුප් වර්ධක ගෙවීම, හදිසි අනතුරු වන්දි ගෙවීම.
- ප්‍රවාහන කටයුතු අධීක්ෂණය හා ක්ෂේත්‍ර ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාව.

### 1.3.1.11 මුදල් අංශය

- දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ශීර්ෂවල හා වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීම, කලාප කාර්යාලවලට ඒවා ලබාදීම, ප්‍රාදේශීය කාර්යාලවල අග්‍රිම ප්‍රතිපූර්ණය, සියළුම ලැබීම් ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා කිරීම හා මාසික ගිණුම් වාර්තා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම.
- වාර්ෂිකව ආදායම්, වියදම්, වනසත්ත්ව සංරක්ෂණ අරමුදල, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සහ පොදු තැන්පත් සඳහා ගිණුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

- ප්‍රධාන කාර්යාලයේ සියළු ප්‍රසම්පාදන කටයුතු හා ගබඩාවේ කටයුතු අධීක්ෂණය හා පාලනය.
- විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන සියළුම විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

### 1.3.2 අන්තර් ජාතික සම්මුතීන්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අන්තර්ජාතික සම්මුතීන් 03 ක දේශීය කළමනාකාරීත්ව අධිකාරිය ලෙස ක්‍රියාකරනු ලබයි. එම සම්මුතීන් පහත දක්වා ඇත.

- වඳ වී යාමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (CITES - Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora)
- තෙත් බිම් පිළිබඳ රම්සා ජාත්‍යන්තර සම්මුතිය - (Convention on Wetlands / Ramsar Convention)
- පර්යටනික වන සත්ත්ව විශේෂ සංරක්ෂණය සඳහා වන සම්මුතිය - (Conventon on the Conservation of Migratory Species of Wild Animals / Bonn Convention)

1.4 **සංවිධාන සටහන** (2024.12.31 දිනට යාවත්කාලීන කරන ලද සංවිධාන සටහන පිටුව 9)



## 1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

**වනජීවී සංරක්ෂණ අරමුදල (ව.සං.අ.)**

වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය ලබාගැනීමේ අරමුණින් 1967 දී පිහිටුවන ලද මෙම අරමුදලේ අරමුණු පහත දැක්වේ.

- වනසතුන්ගේ ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජනතාවගේ දායකත්වය සහ සහයෝගය වැඩිකර ගැනීම.
- වනජීවී රක්ෂිත ප්‍රදේශ නඩත්තු කිරීම.
- වනජීවී සංරක්ෂණය සඳහා දක්වනු ලබන දායකත්වය අගය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ නිලධාරීන්ට සහ මහජනතාවට ත්‍යාග මුදල් සහ වෙනත් ප්‍රසාද දීමනා ගෙවීම.
- වනජීවී අපරාධවලට එරෙහිව තොරතුරු ලබාදෙන්නන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.

**පරිච්ඡේදය 02**

**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

## 2.1 මූල්‍ය ප්‍රගති සාරාංශය

### 2.1.1 ඒකාබද්ධ අරමුදල

| **වියදම් කාණ්ඩය** | **2024 ඇස්තමේන්තුගත මුදල (රුපියල් මිලියන)** | **2024.12.31 දිනට වියදම ( රුපියල් මිලියන)** | **මූල්‍ය ප්‍රගතිය (%)** |
|---|---|---|---|
| මූලධන වියදම් | 292.00 | 253.90 | 86.95 |
| පුනරාවර්තන වියදම් | 4,638.00 | 3288.46 | 70.90 |
| **එකතුව** | 4,930.00 | 3542.30 | 71.85 |

### 2.1.2 වනසත්ත්ව සංරක්ෂණ අරමුදල

| **වියදම් කාණ්ඩය** | **2024 ඇස්තමේන්තුගත මුදල (රුපියල් මිලියන)** | **2024.12.31 දිනට වියදම (රුපියල් මිලියන)** | **මූල්‍ය ප්‍රගතිය (%)** |
|---|---|---|---|
| මූලධන වියදම් | 768.28 | 755.13 | 98.28 |
| පුනරාවර්තන වියදම් | 2,407.147 | 2,393.707 | 99.44 |
| එකතුව | 3,175.427 | 3,148.839 | 99.16 |

**2.2** ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය -

**2.2.1** ඒකාබද්ධ අරමුදල

| වැය විෂය අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රුපියල් මිලියන) | % |
| මූලධන වත්කම් වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම | | | | |
| 284-01-01-2001 | ගොඩනැඟිලි හා නිර්මිතයන් අළුත්වැඩියා කිරීම | 10.00 | 8.78 | 87.84 |
| 284-01-01-2002 | යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම | 4.00 | 2.92 | 73.15 |
| 284-01-01-2003 | වාහන අළුත්වැඩියාව | 10.00 | 8.53 | 85.37 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | | | | |
| 284-01-01-2105 | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම (රක්ෂිත ප්‍රදේශ තුළ මායිම් සළකුණු කිරීම) | 5.00 | 3.21 | 64.24 |
| 284-01-01-2401 | මානව සම්පත් සංවර්ධනය කිරීම | 8.00 | 6.19 | 77.42 |
| 284-01-01-2506 | රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 1.78 | 1.02 | 57.57 |
| 284-01-01-08-2105 | විදුලි වැටවල් ඉදිකිරීම | 150.00 | 123.51 | 82.35 |
| 284-01-01-09-2506 | රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම | 80.00 | 76.61 | 95.00 |
| 284-01-01-10-2506 | රක්ෂිත ප්‍රදේශවල මාර්ග ජාලය වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම | 20.00 | 19.88 | 99.42 |
| 284-01-01-15-2509-17 | විල්පත්තු ජාතික උද්‍යානය අවට බලපෑම් කලාපය කළමනාකරණ ව්‍යාපෘතිය (GIZ) | 3.21 | 3.21 | 100 |
| **මුළු එකතුව** | | 292.00 | 253.90 | 86.96 |

**2024.12.31** දිනට විශේෂ අය වැය යෝජනා යටතේ සංවර්ධන වැඩසටහන් නොමැත.

## 2.2.2 වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගති සාරාංශය (ලැබීම් ගෙවීම් ගිනුම අනුව )

| වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2024.12.31 දිනට වියදම (පුනරාවර්තන) | | | | |
|---|---|---|---|---|
| වැය විෂය | විස්තරය | ඇස්තමේන්තුව රු.මි | මුළු වියදම රු.මි | ප්‍රගතිය % |
| 3000 | අලි ඇල්ලීම, අලි පළවාහැරීම් හා අනතුරට පත් අලින් මුදවා ගැනීම | 8.68 | 8.68 | 100.00% |
| 3001 | මියගිය වන අලි ඉවත් කිරීම/වළ දැමීම හා වෙනත් මියගිය සතුන් අපහරණය | 5.45 | 5.43 | 99.63% |
| 3002 | සතුන් සඳහා ආහාර | 160.85 | 160.81 | 99.97% |
| 3003 | මෙහෙයුම් ද්‍රව්‍ය හා උපාංග (වෛද්‍ය සැපයීම්) | 19.40 | 19.38 | 99.89% |
| 3004 | නිලධාරීන්ගේ රෝහල් හා වෛද්‍ය ගාස්තු | 0.16 | 0.16 | 100.00% |
| 3005 | නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරික හානි සඳහා වන්දි | 0.57 | 0.56 | 98.24% |
| 3006 | නීතිඥ ගාස්තු | 0.58 | 0.57 | 98.27% |
| 3007 | සේවා ගාස්තු | 744.10 | 744.06 | 99.99% |
| 3008 | යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ ,ගොඩනැගිලි සුළු නඩත්තු | 16.85 | 16.82 | 99.82% |
| 3009 | විදුලි වැට නඩත්තු | 39.02 | 39.01 | 99.97% |
| 3010 | වාහන අලුත්වැඩියා සුළු නඩත්තු | 133.80 | 133.30 | 99.62% |
| 3011 | බංගලා වල රෙදි පිරිසිදු කිරීම | 3.12 | 3.11 | 99.67% |
| 3012 | විවිධ වියදම් | 107.05 | 106.53 | 99.51% |
| 3013 | විදුලිය,ජලය හා දුරකථන | 33.90 | 33.80 | 99.70% |
| 3014 | තුවක්කු බලපත්‍ර ගාස්තු | 0.25 | 0.23 | 92.00% |
| 3015 | ගුවන්විදුලි පණිවුඩ | 2.85 | 2.83 | 99.29% |
| 3016 | මහජනයාට, සතුන්ගෙන් වන හානි සඳහා වන්දි | 148.10 | 136.54 | 92.19% |
| 3017 | සම්මුති සම්මන්ත්‍රණ හා දයක මුදල් | 5.05 | 5.00 | 99.00% |
| 3018 | වනජීවී සංරක්ෂණය සම්බන්ධ අධ්‍යාපන සහ ව්‍යාප්ති කටයුතු | 4.61 | 4.61 | 100.00% |
| 3019 | සේවා ගිවිසුම් | 21.00 | 20.81 | 99.09% |
| 3020 | ස්වේච්ඡා මාර්ගෝපදේශක දීමනා | 96.00 | 95.83 | 99.82% |

| වැය විෂය | විස්තරය | ඇස්තමේන්තුව | මුළු වියදම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 3021 | ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම් වලින්) | 70.52 | 70.47 | 99.92% |
| 3022 | දිරි දීමනා | 114.30 | 114.27 | 99.97% |
| 3023 | නඩත්තු සේවක ආහාර දීමනා | 44.72 | 44.71 | 99.97% |
| 3024 | දේශීය ගමන් වියදම් | 89.90 | 89.84 | 99.93% |
| 3025 | විදේශීය ගමන් වියදම් | 4.57 | 4.58 | 100.21% |
| 3026 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය වියදම් | 8.65 | 8.62 | 99.65% |
| 3027 | ඉන්ධන | 157.55 | 157.52 | 99.98% |
| 3028 | අලි වෙඩි මිළදී ගැනීම හා රබර් උණ්ඩ මිලදී ගැනීම | 351.75 | 351.74 | 99.99% |
| 3029 | උද්‍යාන හා සංචාරක නිවාස සඳහා අවශ්‍ය සුළු මිලදී ගැනීම | 13.75 | 13.74 | 99.92% |
| 3030 | නිල ඇඳුම් සහ උපාංග | 0.007 | 0.0061 | 87.14% |
| | පුනරාවර්තන වියදම් - එකතුව | 2,407.147 | 2393,707 | 99.44% |

| වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ **2024.12.31** දිනට වියදම (ප්‍රාග්ධන) | | | | |
|---|---|---|---|---|
| **වැය විෂය** | **විස්තරය** | **ඇස්තමේන්තුව** | **මුළු වියදම** | **ප්‍රගතිය** |
| 3500 | යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ , ගොඩනැගිලි නඩත්තුව | 37.02 | 37.02 | 100.00 % |
| 3501-1 | උද්‍යානවල සංචාරකයින්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම | 205.25 | 205.25 | 100.00% |
| 3501-2 | සංචාරක නිවාස සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 20.40 | 20.37 | 99.85% |
| 3501-3 | සත්ත්ව සුබසාධන හා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම | 49.80 | 49.78 | 99.95% |
| 3502 | යන්ත්‍රෝපකරණ,වාහන , බෝට්ටු සහ ගිණි අවි මිලදී ගැනීම | 23.30 | 23.29 | 99.95% |
| 3503 | වාහන නඩත්තු | 6.37 | 3.32 | 52.11% |

| | | | | |
|---|---|---|---|---|
| 3504 | ප්‍රධාන කාර්යාලයේ අංශවල පහසුකම් වැඩි දියුණු කිරීම | 19.55 | 19.53 | 99.89% |
| 3505 | ජනවිහිදුම්කරණ | 5.76 | 5.75 | 99.82% |
| 3506 | සමුද්‍ර ජීවී සංරක්ෂණය | 7.11 | 7.10 | 99.85% |
| 3507-1 | වාසස්ථාන සුපෝෂණ කටයුතු | 23.35 | 23.30 | 99.78% |
| 3507-2 | උද්‍යාන මැනුම් සහ මායිම් සලකුණු කිරීම | 19.00 | 18.98 | 99.89% |
| 3508-1 | විදුලි වැට ඉදිකිරීම | 62.67 | 53.50 | 85.36% |
| 3508-2 | විදුලි වැට මුරකුටි ඉදිකිරීම | 74.10 | 74.00 | 99.86% |
| 3509 | කාර්යාල උපකරණ | 62.62 | 62.50 | 99.80% |
| 3510 | නඩත්තු කටයුතු සඳහා අවශ්‍යා උපකරණ | 2.07 | 2.05 | 99.03% |
| 3511 | මෘදුකාංග පද්ධති නිර්මාණය කිරීම | 0.32 | 0.30 | 93.75% |
| 3512 | දේශීය පුහුණු | 149.55 | 149.01 | 99.63% |
| ප්‍රාග්ධන වියදම් - එකතුව | | 768.20 | 755.13 | 98.28% |
| මුළු එකතුව (පුනරාවර්ථන හා ප්‍රග්ධන වියදම්) | | 3,175.42 | 3,148.84 | 99.16% |

**2.3 ඒකාබද්ධ අරමුදල හා වනසත්ත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශනය | ඒකකය | 2024.12.31. නිමැවුම | |
|---|---|---|---|---|
| | | | ඒකාබද්ධ අරමුදල | වනසත්ත්ව සංරක්ෂණ අරමුදල |
| **වාසස්ථාන සුපෝෂණ කටයුතු** | | | | |
| නාමපුවරු සකස් කිරීම හා අළුත්වැඩියාව | ස්ථාපිත කරන ලද හා අළුත්වැඩියා කරන ලද දැන්වීම් පුවරු (ගිරිතලේ, ගල්ඔය, හම්බන්තොට,උඩවලව, තණමල්විල,කුරුණෑගල, අම්පාර,) | සංඛ්‍යාව | 67 | 50 |
| ජාතික උද්‍යාන මැණුම් කිරීම- මායිම් කණු සිටුවීම | ජාතික උද්‍යාන මැණුම් කිරීම- හොරොව්පතාන ජාතික උද්‍යානය ප්‍රකාශිත මායිම, අලිගාල මායිම, උද්‍යාන මායිම ඇතුලත පිහිටි වැව් 22 වටා ) | හෙක්ටයාර | - | 44 |
| | මායිම් කණු සිටුවීම | සංඛ්‍යාව | - | 36 |

| | | | | |
|---|---|---|---|---|
| | (මුතුරාජවෙළ,) | | | |
| | (සමනල අඩවිය හා ජල ගැනුම් නිම්නය ) | සංඛ්‍යාව | 229 | - |
| ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම | විල්පත්තුව,තබ්බෝව,බූන්දල ජාතික උද්‍යාන සහ වාංකාලේ අභය භූමිය | හෙක්ටයාර | 76.18 | - |
| | උඩවලව ජාතික උද්‍යානය, යාල අරංගමුව කළාපය | හෙක්ටයාර | - | 30.14 |
| තෘණභූමි කළමණාකරණය | විල්පත්තුව,කුමන,මාදුරුඔය,මින්නේරිය,ජලගැලුම් නිම්න හා සෝමාවතිය ජාතික උද්‍යාන | හෙක්ටයාර | 181.9 | - |
| | හොරොව්පතාන හා උඩවලව ජාතික උද්‍යාන | හෙක්ටයාර | - | 33.14 |
| මාර්ගය දෙපස යටිකැලය ඉවත් කිරීම | විල්පත්තුව,කුමන,මාදුරුඔය, කවුඩුල්ල,මින්නේරිය,උඩවලව ජාතික උද්‍යාන යාල කලාප vi (ලුණුගම්වෙහෙර), ගල්ඔය,යාල කලාප 1, යාල කලාප iv සහ v, ගිරිතලේ පුහුණු කේන්ද්‍රය,) | හෙක්ටයාර | 312.27 | - |
| මාර්ගය දෙපස යටිකැලය ඉවත් කිරීම | ලාහුගල ජාතික උද්‍යානය,වස්ගමුව ජාතික උද්‍යානය | හෙක්ටයාර | - | 74.46 |
| ගිනිපටි කළමනාකරණය | රාවණා ඇල්ල අභය භූමිය | හෙක්ටයාර | 6.92 | - |
| ගොඩනැගිලි ඉදි කිරීම හා අළුත්වැඩියාව හා නඩත්තුව | අළුත්වැඩියා කරන ලද කාර්යාල හා පරිපාලන ගොඩනැගිලි | සංඛ්‍යාව | - | 14 |
| | අළුත්වැඩියා කරමින් පවතින පරිපාලන ගොඩනැගිලි | සංඛ්‍යාව | - | 3 |
| | අළුත්වැඩියා කරන ලද බීට්ටු කාර්යාල | සංඛ්‍යාව | 01 | 02 |
| | අළුත්වැඩියා කරන ලද සංචාරක නිවාස | සංඛ්‍යාව | - | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | අළුත්වැඩියා කරන ලද නිල නිවාස | සංඛ්‍යාව | 02 | 03 |
| | ස්ථාපිත කරන ලද විදුලි සැපයුම් හා PABX ජාල පද්ධති | සංඛ්‍යාව | - | 02 |
| | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරන ලද කාර්යාල | සංඛ්‍යාව | 03 | 11 |
| | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරන ලද සංචාරක නිවාස | සංඛ්‍යාව | 0 | 02 |
| මාර්ග ජාලය අළුත්වැඩියාව | විල්පත්තු ජාතික උද්‍යානය, වරාහේන පස්කෙම,අත්තිඩිය,කිරිඔය,උඩවල ව,යාල, කුමන,විල්පත්තුව | කි.මී | 23.5 | 245.34 |
| | අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම් | සංඛ්‍යාව | 10 | 39 |
| රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම | ජල මූලාශ්‍ර ප්‍රතිසංස්කරණය හා නව ඉදිකිරීම. (කුමන ජාතික උද්‍යානයේ සියඹලා ගස්වැව,) | සංඛ්‍යාව | 1 | - |
| | යාල ජාතික උද්‍යානය - පනාගම්මන වැව, දෙයියන්ගේ වැව, අරංගමුව වැව ප්‍රතිසංස්කරණය) | සංඛ්‍යාව | - | 3 |
| | නල ළිං ඉදිකිරීම, (ගිරිබාව ) | සංඛ්‍යාව | 01 | - |
| | වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති (රිටිගල, මැණික් සොරොව්ව, තිඹිරියමංකඩ, උඩවලව, ගිරිතලේ, හික්කඩුව ) | සංඛ්‍යාව | 0 | 07 |
| යන්ත්‍රෝපකරණ වාහන, බෝට්ටු සහ ගිණි අවි මිලදී ගැනීම | සංචාරක බංගලා භාණ්ඩ මිලදී ගැනීම (ගෘහ උපකරණ ඇතුළු විවිධ භාණ්ඩ) | සංඛ්‍යාව | | 582 |
| | වෛද්‍ය උපකරණ - නිර්වින්දන තුවක්කු සඳහා උපකරණ ඖෂධ - විවිධ රු.මි (37.9) | සංඛ්‍යාව | | 10,263 |

| | | | | |
|---|---|---|---|---|
| | කායන්කර්ණි අභයභූමියේ නාම පුවරු හා උපදෙස් පුවරු සකස් කර සවිකිරීම | සංඛ්‍යාව | - | 05 |
| | වේව් රයිඩර් යාත්‍රාව හා සමුද්‍ර සංරක්ෂණ කටයුතු සඳහා භාවිතා කරන බෝට්ටු අලුත්වැඩියා කටයුතු හා චර්යාවන් සිදුකිරීම | සංඛ්‍යාව | - | 02 |
| | කන්දකුලිය නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යෝජිත බිම් කොටසේ මැනුම් කටයුතු | හෙක්ටයාර් | - | 0.1685 |
| සමුද්‍රජීව සංරක්ෂණය | සමුද්‍ර රක්ෂිත ප්‍රදේශයන් ප්‍රකාශයට පත්කිරීමට අදාලව දැනුවත් කිරීමේ වැඩසටහන් (යෝජිත තලවිල රක්ෂිතය ගැසට් කිරීමට අදාළව දැනුවත් කිරීම) | සංඛ්‍යාව | - | 03 |
| | මියගිය සතුන් සංරක්ෂණය කිරීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම | සංඛ්‍යාව | - | 05 |
| | මිරිස්ස සහ රූකව සමුද්‍ර කලාපයේ ප්‍රජා සහභාගීත්ව කැස්බෑ ක්ෂේත්‍ර සමීක්ෂණ වැඩසටහන (කැස්බෑ බිත්තර කැදලි ස්ථානීය සංරක්ෂණය සිදුකර කැස්බෑ පැටවුන් මුදා හැරීම) | සංඛ්‍යාව | - | 1185 |
| සමුද්‍රජීව සංරක්ෂණය | රූකව කපුහේන්වල ප්‍රදේශයේ කැස්බෑ සංරක්ෂණ කටයුතු වලට අදාල උපකරණ හා භාණ්ඩ ආරක්ෂිතව තබා ගැනීම සඳහා ගබඩාවක් ඉදිකිරීම | සංඛ්‍යාව | - | 01 |
| | කුමන ජාතික උද්‍යානයේ කැස්බෑ සංරක්ෂණ තොරතුරු මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කිරීම | සංඛ්‍යාව | - | 01 |

| | | | | |
|---|---|---|---|---|
| | යාල ජාතික උද්‍යානයේ කැස්බෑ හැචරියක් ඉදි කිරීම | සංඛ්‍යාව | - | 01 |
| | වාංකාලේ අඩවි ආරක්ෂක කාර්යාල භූමියේ අනතුරට පත්වන කැස්බෑවන් රඳවා තබා ගැනීම සඳහා ජල ටැංකියක් ඉදි කිරීම | සංඛ්‍යාව | - | 01 |
| | කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම (කැස්බෑ සංරක්ෂණ භාණ්ඩ හා උපකරණ) | සංඛ්‍යාව | - | 30 |
| | ඉලන්තිඅඩිය වනජීවී කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීමට අදාළ පෙරසැරි ගාස්තු ගෙවීම | හෙක්ටයාර් | - | 0.1143 |
| වන සතුන්ට ප්‍රතිකාර කිරීම | ප්‍රතිකාර කරන ලද අලින් සංඛ්‍යාව-(ලුණුගම්වෙහෙර, රණ්දෙනිගල, අම්පාර, ගිරිතලේ,පණ්ඩුලගම, නිකවැරටිය, කිලිනොච්චිය, ඇත්අතුරු සෙවන -උඩවලව ) | සංඛ්‍යාව | - | 459 |
| | ප්‍රතිකාර කරන ලද අනෙකුත් සතුන් -(ලුණුගම්වෙහෙර, රණ්දෙනිගල, අම්පාර, ගිරිතලේ,පණ්ඩුලගම,නිකවැරටිය, කිලිනොච්චිය, ඇත්අතුරු සෙවන - උඩවලව, වනජීවී රැඳවුම් මධ්‍යස්ථානය - අත්තිඩිය. | සංඛ්‍යාව | - | 7,708 |
| වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ | අලින්ගේ සිදුකරන ලද පශ්චාත් මරණ පරීක්ෂණ සංඛ්‍යාව -(ලුණුගම්වෙහෙර, රණ්දෙනිගල,අම්පාර, ගිරිතලේ,පණ්ඩුලගම,නිකවැරටිය, | සංඛ්‍යාව | - | 400 |

| | | | | |
|---|---|---|---|---|
| | කිලිනොච්චිය, ඇත්අතුරු සෙවන - උඩවලව වනජීවී රැඳවුම් මධ්‍යස්ථානය අත්තිඩිය) | | | |
| | ලුණුගම්වෙහෙර, රණ්දෙනිගල, අම්පාර, ගිරිතලේ,පණ්ඩුලගම, නිකවැරටිය,කිලිනොච්චිය,ඇත්අතු රු සෙවන - උඩවලව, වනජීවී රැඳවුම් මධ්‍යස්ථානය - අත්තිඩිය. ( අනෙකුත් සතුන්ගේ සිදුකරන ලද පශ්චාත් මරණ පරීක්ෂණ සංඛ්‍යාව ) | සංඛ්‍යාව | - | 617 |
| උපකරණ මිලදී ගැනීම | තාවකාලික මුව රැඳවුමක් සඳහා GI පයිප්ප | සංඛ්‍යාව | | 45 |
| | තාවකාලික මුව රැඳවුමක් සැකසීම | සංඛ්‍යාව | | 10 |
| | බාහිර දෘඩතැටිය (External Hard Disc TB) | සංඛ්‍යාව | | 03 |
| | නැවත ආරෝපිත බැටරි | සංඛ්‍යාව | | 16 |
| | විදුලි ආරෝපකය (Charger ) | සංඛ්‍යාව | | 03 |
| | කැමරාව පසු අසුරන (Camera Back Pack) | සංඛ්‍යාව | | 01 |
| | රවුටර (Routers ) | සංඛ්‍යාව | | 03 |
| | SSD | සංඛ්‍යාව | | 02 |
| | Lowback Chair | සංඛ්‍යාව | | 20 |
| | පරිගණක මේස | සංඛ්‍යාව | | 03 |
| | වානේ අල්මාරි | සංඛ්‍යාව | | 04 |
| | සේප්පු | සංඛ්‍යාව | | 10 |
| | ජල පෙරණ | සංඛ්‍යාව | | 01 |
| | ලැප්ටොප් පරිගණක | සංඛ්‍යාව | | 01 |
| | UPS | සංඛ්‍යාව | | 03 |
| | මේසයේ තබන පරිගණක (DeskTop Computers ) | සංඛ්‍යාව | | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | නැවත ආරෝලණය කළ හැකි බැටරි | සංඛ්‍යාව | | 160 |
| | බටරි සඳහා ආරෝපක | සංඛ්‍යාව | | 10 |
| | අල්මාරි | සංඛ්‍යාව | | 17 |
| | කබර්ඩ් | සංඛ්‍යාව | | 11 |
| | කබර්ඩ් සහිත අල්මාරි | සංඛ්‍යාව | | 07 |
| | ඡායාපිටපත් යන්ත්‍ර | සංඛ්‍යාව | | 10 |
| | වායු සමීකරණ යන්ත්‍ර | සංඛ්‍යාව | | 02 |
| | ජලයේ ගිලාබැස්විය හැකි ජල මෝටර් | සංඛ්‍යාව | | 02 |
| | බැටරි ඇම්පියර් 90 | සංඛ්‍යාව | | 195 |
| | බැටරි ඇම්පියර් 100 | සංඛ්‍යාව | | 83 |
| උපකරණ මිලදී ගැනීම | බැටරි ඇම්පියර් 200 | සංඛ්‍යාව | | 03 |
| | ජිග්සෝ | සංඛ්‍යාව | | 01 |
| | චේන්සෝ | සංඛ්‍යාව | | 01 |
| | පිරිසිදු කිරීමේ යන්ත්‍ර (Vaccum Cleaner) | සංඛ්‍යාව | | 01 |
| | මේස | සංඛ්‍යාව | | 13 |
| | පුටු | සංඛ්‍යාව | | 13 |
| | ආරක්ෂිත බෝට්ටු | සංඛ්‍යාව | | 20 |
| | කාර්යාල සේප්පු | සංඛ්‍යාව | | 01 |
| | ජල මෝටර් | සංඛ්‍යාව | | 01 |
| | රඳවන විදුලි පංකා | සංඛ්‍යාව | | 16 |
| | ඇඟිලි සළකුණු යන්ත්‍ර | සංඛ්‍යාව | | 01 |
| | දැවකණු – Line post | සංඛ්‍යාව | | 4366 |
| | කොන්ක්‍රීට් කරන ලද කණු Concrete Post | සංඛ්‍යාව | | 1435 |
| | ආධාරක කණු Support Post | සංඛ්‍යාව | | 786 |
| | හෝර්ටන් තරන්න ජාතික උද්‍යානය සඳහා බැටරි | සංඛ්‍යාව | | 14 |

| | | | | |
|---|---|---|---|---|
| | විදුලි වැට සඳහා බැටරි | සංඛ්‍යාව | | 13 |
| | පරිගණක | සංඛ්‍යාව | | 01 |
| | ඩයතම් උපකරණ | සංඛ්‍යාව | | 01 |
| | වාතන සැපයුම් උපකරණ Ventilator | සංඛ්‍යාව | | 01 |
| | නිර්වින්දන උපකරණ Anesthetic Machine 1 & Ventilator 1 | සංඛ්‍යාව | | 2 |
| | GPS භූගෝලීය පාඨාංක නිරීක්ෂණ උපකරණ | සංඛ්‍යාව | | 3 |
| | උගුල් කැමරා උපකරණ | සංඛ්‍යාව | | 2 |
| ජනවිඥදුම්කරණය | පොළොන්නරුව කළාපයේ ධීවර ප්‍රජාව අදායම් උත්පාදනය සඳහා මිරිදිය මත්ස්‍ය පැටවුන් කවුඩුල්ල හා මින්නේරිය ජලාශ සඳහා මුදා හැරීම | සංඛ්‍යාව | - | 01 |
| | ශ්‍රී පාද අඩවිය හා යාල ජාතික උද්‍යානයේ කලාප අංක (02) හි ශ්‍රමදාන වැඩසටහන් | සංඛ්‍යාව | - | 08 |
| | පුත්තලම වනජීවී කලාපයේ අවශ්‍යතා ඇති පාසැල් සිසුන් සඳහා පාසැල් උපකරණ ලබා දීම | සංඛ්‍යාව | - | 50 |
| | ජපන් ජබර ආශ්‍රිත අත්කම් නිර්මාණ වැඩමුළු | සංඛ්‍යාව | - | 03 |
| | සූර්ය ජනන බල්බ විදුලි ලබා දීම - තික්කෝඩේ හා පිල්ලුමලේ සඳහා | සංඛ්‍යාව | - | 30 |

**2.3.1 විදුලි වැට ඉදිකිරීම**

**2024.12.31 දිනට ප්‍රගතිය**

| වනජීවී කළාපය | දිස්ත්‍රික්කය | විදුලි වැටේ නම | විදුලි වැටේ දිග (මී.කි) | ඉදිකර අවසන් විදුලි වැටේ දිග (කි.මී) | මේ දක්වා ගෙවීම් කර ඇති ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|---|---|---|
| නැගෙනහිර | අම්පාර | 17 කොළණිය | 6.00 | 6.00 | 0.80 |
| මධ්‍යම | බදුල්ල | මාදුරුඔය -වස්ගමුව | 22.30 | 22.30 | 3.40 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | පෙරියකුලම් | 4.50 | 4.50 | ඉදිකර අවසන් ගෙවීම් කර නැත |
| | | මහින්දපුර - සුමේධංකරපුර1 | 8.37 | 8.37 | 1.86 |
| | | මහින්දපුර - සුමේධංකරපුර2 | 11.83 | 11.83 | 1.59 |
| කිළිනොච්චිය | කිළිනොච්චිය | එඩික්කට්ටු - තොට්ටිඅඩි1 | 10.00 | 10.00 | 0.86 |
| | | මෙලිවනම් ගම වටා | 2.65 | 2.65 | 0.29 |
| අනුරාධපුරය | අනුරාධපුරය | කිරල්පැටියාව - ඔයාමඩුව | 15.00 | 2023 වර්ෂයේ ඉදිකර අවසන් | 8.14 |
| | | ඔයාමඩුව - ඊට්ටිකුලම | 35.00 | 27.40 | |
| | | කිවුලේකඩ - වන්නම්කුලම් | 104.00 | 24.00 | 12.20 |
| | | වේලගන්උල්පත - කිවුලේකඩ | 61.00 | 27.50 | 8.86 |
| | | කුඹුක්වැව - මඩවල | 15.00 | 39.70 | 12.88 |
| | | මඩවල - එප්පාවල | 12.00 | | |
| | | එප්පාවල - කුඹුක්වැව | 14.00 | | |
| වවුනියාව | වවුනියාව | ක්‍රිස්තුවකුලම් | 7.50 | 0.00 | 1.16 |
| | | ඔට්ටාර්කුලම් - කනගම්පුරම් | 17.00 | 7.08 | 2.72 |
| | | සින්නසිට්ටිකුලම් - ආනවිල්ලුම්දාම්කුලම් | 11.00 | 0.00 | 2.29 |
| | | සින්නතම්පනේ | 5.00 | 0.00 | 0.82 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනුරාධපුරය | බලයාවැව 2 කණුව | 15.00 | 5.55 | 1.57 |
| | | 2 කණුව - කුඹුක් වැව | 10.80 | 0 | |
| | | ගල්කුලම - බලයාවැව | 14.50 | 2023 වර්ෂයේ කොටසක් ඉදි කර (9.6) | |
| | | අරුණගම - දංගොල්ල | 23.00 | 2.30 | 1.18 |
| | | ග්‍රේවල්කන්ද | 7.50 | 2023 වර්ෂයේ කොටසක් ඉදි කර ඇත. (5.35) | |
| ඌව | මොණරාගල | මුල්ලේගම -දුම්පදුරාව | 18.00 | 6.60 | 1.86 |
| | | හැවැන්පිටි - වෙහෙරගල බුබරට හැරෙන පාර | 10.00 | 6.20 | 0.20 |
| දකුණ | රත්නපුර | දෙහිපිටිය ගම වටා | 1.90 | 1.90 | 1.06 |
| | | කෙරතල ගම වටා | 2.20 | 2.20 | 0.68 |
| | | සමනල වෙල්ල සිට රජවක හරහා මුල්ගම | 14.00 | 7.00 | 1.53 |
| | | නවනැලිය 10 කණුව සිට දූවිලි ඇල්ල | 16.80 | 6.50 | 0.84 |
| වයඹ | කුරුණෑගල | මීඔය -පයිරික්කුලම | 14.50 | 8.50 | 2.19 |
| | | ඉගිණිමිටිය - රනෝරාව | 7.30 | 0.00 | 1.91 |
| එකතුව | | | | **238.08** | **70.98** |

### 2.3.2 වන අලි මිනිස් ගැටුම අවම කිරීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ වන විට විදුලි වැට කි.මී 5,620.96ක් නඩත්තු කරන අතර එහි නඩත්තු කටයුතු සඳහා අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂකයන් 2,673ක් හා වනඅලි පලවාහැරීම සඳහා සිවිල් ආරක්ෂක නිලධාරීන් 752 ක් අනුයුක්ත කර ඇත.

| කාරණය | ප්‍රධාන කාර්ය දර්ශනය | ඒකකය | 2024.12.31 නිමවුම | |
|---|---|---|---|---|
| | | | ඒකාබද්ධ අරමුදල | වනසත්ත්ව සංරක්ෂණ අරමුදල |
| වන අලි මිනිස් ගැටුම අවම කිරීම | විදුලි වැට ඉදි කිරීම | කි.මී | - | 238 |
| | විදුලි වැට උපකරණ මිලදී ගැනීම | ප්‍රතිශතය | 100 | - |
| | විදුලි වැට ආරක්ෂික කුටි ඉදි කිරීම | සංඛ්‍යාව | | 113 |
| | මිලදී ගන්නා ලද අලි වෙඩි ප්‍රමාණය | සංඛ්‍යාව | | 1,640,568 |

2024 වසරේ වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලි වෙඩි මිල දී ගෙන වනඅලි තර්ජන සහිත ප්‍රදේශවලට බෙදා හැර ඇත.

| අලිවෙඩි වර්ගය | ප්‍රමාණය | වියදම (රුපියල් මිලියන) |
|---|---|---|
| ගිගුම් (ලොකු) | 400,000 | 84.00 |
| ගිගුම් (පොඩි) | 790,568 | 150.20 |
| සංඥා දහර | 450,000 | 119.25 |
| **එකතුව** | 1,640,568 | 353.45 |

| 2024 වර්ෂයේ අලිවෙඩි බෙදා හැරීම් | | | | |
|---|---|---|---|---|
| වනජීවී කලාපය | සංඛ්‍යාව | | | |
| | ගිහුම්වෙඩි (ලොකු) | ගිහුම්වෙඩි (කුඩා) | සංඥා වෙඩි | එකතුව |
| පොළොන්නරුව | 39500 | 107300 | 61500 | 208300 |
| අනුරාධපුරය | 39650 | 96400 | 61340 | 197390 |
| වයඹ | 37700 | 93650 | 59000 | 190350 |
| නැගෙනහිර | 53350 | 100875 | 66775 | 221000 |
| දකුණ | 50265 | 79415 | 51650 | 181330 |
| මධ්‍යම | 47615 | 68200 | 38215 | 154030 |
| ඌව | 34225 | 68028 | 28175 | 130428 |
| පුත්තලම | 36200 | 56600 | 28475 | 121275 |
| වව්නියාව | 12592 | 26348 | 13350 | 52290 |
| ත්‍රිකුණාමලය | 38400 | 70555 | 30200 | 139155 |
| කිලිනොච්චිය | 10503 | 23197 | 11320 | 45020 |
| **එකතුව** | 400000 | 790568 | 450000 | 1640568 |

### 2.3.3 වනඅලි හානි සඳහා වන්දි ගෙවීම

දිවයින පුරා වනඅලි පහරදීම් හේතුවෙන් පීඩාවන්ට පත් වූ ජනතාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා වනඅලි හානි සඳහා වන්දි ගෙවීම සිදු කරන අතර 2024.12.31 වන විට ගෙවන ලද වන්දි ප්‍රමාණයන් පහත පරිදි වේ.

| දිස්ත්‍රික් වන්දි කමිටුවල මූල්‍ය ප්‍රගතිය - 2024 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මරණ | | ශාරීරික හානි | | දේපළ හානි | | වන්දි සඳහා ගෙවා ඇති මුලු මුදල (රු. මි ) |
| | 2024 සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රු.මි) | 2024 සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රු.මි) | 2024 සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රු.මි) | |
| අනුරාධපුරය | 32 | 33.50 | 41 | 3.92 | 1029 | 56.95 | 94.37 |
| පොළොන්නරුව | 21 | 17.80 | 26 | 1.03 | 509 | 28.86 | 47.70 |
| මාතලේ | 6 | 6.90 | 4 | 0.18 | 63 | 3.62 | 10.71 |
| කුරුණෑගල | 17 | 17.10 | 12 | 3.15 | 328 | 15.34 | 35.59 |
| මහනුවර | 0 | 1.00 | - | - | 116 | 5.85 | 6.85 |
| ත්‍රිකුණාමලය | 9 | 3.80 | 7 | 0.18 | 182 | 10.05 | 14.03 |
| මඩකලපුව | 11 | 13.10 | 40 | 2.59 | 259 | 20.74 | 36.44 |
| අම්පාර | 18 | 12.10 | 39 | 6.26 | 529 | 32.98 | 51.34 |
| හම්බන්තොට | 10 | 7.70 | 7 | 4.14 | 100 | 4.50 | 16.35 |
| මොනරාගල | 11 | 5.60 | 5 | 1.39 | 120 | 6.42 | 13.42 |
| පුත්තලම | 6 | 6.00 | 9 | 1.40 | 60 | 2.86 | 10.26 |
| කිළිනොච්චිය | 0 | - | - | - | - | - | - |
| මුලතිවු | 1 | 3.00 | - | - | 11 | 0.86 | 3.86 |
| වවුනියාව | 7 | 5.00 | 2 | 0.027 | 7 | 0.37 | 5.39 |
| කළුතර | 1 | 0.10 | - | - | - | - | 0.10 |
| ගාල්ල | | - | 1 | 0.052 | | - | 0.05 |
| රත්නපුරය | - | - | - | - | 9 | 0.39 | 0.39 |
| මන්නාරම | 2 | 1.00 | 4 | 1.21 | 2 | 0.10 | 2.31 |
| බදුල්ල | 4 | 3.80 | 5 | 0.24 | 432 | 28.77 | 32.82 |
| කොළඹ | 1 | 1.00 | | | | | 1.00 |
| **එකතුව** | **157** | **138.50** | **202** | **25.81** | **3756** | **218.74** | **383.05** |

**සැ.යු-කොළඹ සහ කළුතර කිඹුල් ප්‍රහාර හේතුවෙන් සිදු වූ මිනිස් මරණ 02 ඇතුළුව.**

**2.3.4 වඳ වී යාමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය යටතේ සහ සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම**

වඳ වී යාමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (CITES -The Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora) යටතේ බලපත්‍ර 1020 ද සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත යටතේ (Fauna and Flora Protection Ordinance) බලපත්‍ර 110 ද නිකුත් කර ඇත. එමඟින් ලබා ගෙන ඇති මුළු ආදායම රුපියල් මිලියන 1.59 කි.

**2.3.5 නීතිය ක්‍රියාත්මක හා කිරීම ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රසාද දීමනා ගෙවීම**

වනජීවී අපරාධ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් 2024 වර්ෂයේදී සිදුකරන ලද වැටලීම් වලින් පසු පවරන ලද නඩු සංඛ්‍යාව 1317 වෘක්ෂ ලතා ආරක්ෂක ආඥා පනත යටතේ නීතිය ක්‍රියාත්මක කර දඩ මුදල් ලෙස වනසත්ව සංරක්ෂණ අරමුදලට බැර කරන රුපියල් මිලියන 152.32 ක් වූ ආදායමෙන් රුපියල් මිලියන 69.85 ක් ප්‍රසාද දීමනා ලෙස වැටලීම් වලට දායක වූ නිලධාරීන්ට ගෙවා ඇත.

### 2.3.6 - 2024.12.31 දිනට සංචාරක පැමිණීම පිළිබඳ තොරතුරු

| ජාතික උද්‍යානය - ස්ථානය | සංචාරක පැමිණීම | | |
|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව |
| යාල | 293,058 | 353,646 | 646,704 |
| හෝර්ටන්තැන්න | 296,515 | 52,883 | 349,398 |
| උඩවලව | 139,102 | 136,979 | 276,081 |
| වස්ගමුව | 12,538 | 2,733 | 15,271 |
| මින්නේරිය | 78,397 | 76,086 | 154,483 |
| බූන්දල | 7,469 | 7,194 | 14,663 |
| හොරගොල්ල | 11,573 | 49 | 11,622 |
| කවුඩුල්ල | 22,334 | 21,582 | 43,916 |
| ගල්ඔය | 7,256 | 6,734 | 13,990 |
| කුමන | 24,614 | 10,980 | 35,594 |
| අංගම්මැඩිල්ල | 637 | 5 | 642 |
| ගැල්වේස්ලෑන්ඩ් | 15,105 | 674 | 15,779 |
| විල්පත්තුව | 75,903 | 54,216 | 130,119 |
| මාදුරුඔය | 1,877 | 342 | 2,219 |
| ලාහුගල | 646 | 41 | 687 |
| පරෙවි දූපත | 57,957 | 12,535 | 70,492 |
| හික්කඩුව | 36,421 | 1,492 | 37,913 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 122,816 | 89,157 | 211,973 |
| කලාවැව | 557 | 17 | 574 |
| මිරිස්ස | 31,417 | 88,201 | 119,618 |
| වැලිපර අභයභූමිය | 10,139 | 3,146 | 13,285 |
| ගිරිතලේ | 9,092 | 75 | 9,167 |
| **එකතුව** | **1,255,423** | **918,717** | **2,174,140** |

### 2.3.7 2024.12.31 දිනට සංචාරක ආදායම් පිළිබඳ තොරතුරු

| 2024.12.31 දිනට ආදායම ( රුපියල්) | | |
|---|---|---|
| අ/අ | ස්ථානය | ආදායම |
| 1 | යාල | 3,856,059,497.21 |
| 2 | උඩවලව | 1,711,563,633.60 |
| 3 | මින්නේරිය | 684,393,967.80 |
| 4 | හෝර්ටන් තැන්න | 635,025,527.75 |
| 5 | විල්පත්තු | 598,909,295.46 |
| 6 | මිරිස්ස | 526,797,623.55 |
| 7 | කවුඩුල්ල | 216,850,248.77 |
| 8 | උඩවලව අලිරැදවුම් මධ්‍යස්ථානය | 186,193,142.04 |
| 9 | පරවිදුපත | 182,056,595.00 |
| 10 | කුමන | 71,408,708.68 |
| 11 | ගල්ඔය | 51,480,014.83 |
| 12 | බූන්දල | 42,631,313.95 |
| 13 | වස්ගමුව | 21,791,627.75 |
| 14 | හික්කඩුව | 10,342,115.76 |
| 15 | කල්පිටිය | 9,046,845.72 |
| 16 | ගැල්වෙස්ලැන්ඩ් | 3,748,421.04 |
| 17 | ලාහුගල | 1,485,168.65 |
| 18 | මාදුරුඔය | 2,744,112.76 |
| 19 | හොරගොල්ල | 621,779.03 |
| 20 | ගිරිතලේ | 473,871.68 |
| 21 | අංගම්මැඩිල්ල | 473,158.06 |
| 22 | රන්දෙණිගල | 243,342.00 |
| 23 | කලාවැව | 230,933.71 |
| 24 | මහකනදරාව | 221,250.00 |
| 25 | වුන්ඩිකුලම | 138,768.00 |
| 26 | මිහින්තලේ | 85,174.00 |
| 27 | කතරගම | 67,266.00 |
| | එකතුව | 8,815,083,402.80 |

සටහන: ස්ථාන අනුව ආදායම් හඳුනා ගැනීමේ දී 18% Vat අගය ඇතුලත්ව ඇති අතර එයට අමතරව මිරිස්ස ආදායම තුල වරාය ගාස්තු ද ඇතුලත්ව ඇති අතර එම අගයන් සහ ලැබිය යුතු අගයන්ද ගැලපීමෙන් පසු 2024 ආදායම ලෙස රුපියල් 8,815,083,402.80 ගිණුම තුල දක්වා ඇත.

## 2.4 2024 වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුව ලබා ගත් විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

1.විශේෂ ජයග්‍රහණ

- දීපව්‍යාප්ත වන අලි සමීක්ෂණය සිදුකිරීම
- වනජීවී සංරක්සණ දෙපාර්තමේන්තුවේ Blue Green Media You Tube Channel - සඳහා 2024 වසරට අදාළව වැඩසටහන් නිෂ්පාදනය කිරීම
- WILDLANKA අන්තර්ජාතික පර්යේෂණ සඟරාව (අවුරුද්දකට කලාප 4 ක් බැගින්) ප්‍රකාශයට පත්කිරීම සහ පර්යේෂණ සැසිය පැවැත්වීම.
- Wetland News Letter අවුරුද්දකට කළාප **02** ක් වශයෙන් නොකඩවා ප්‍රකාශයට පත්කිරීම
- වනජීවී ඡායාරූපකරණය, සාරධර්ම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සම්බන්ධ මාසික දේශව හා පාඨමාලා පැවැත්වීම
- ලෝක තෙත්බිම් දන ජාතික උත්සවය පැවැත්වීම
- ලෝක පරිසර දිනය වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීම ( ලෝක පරිසර දිනය සඳහා හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේ දී ආක්‍රමණශීලී ශාක ගැලවීම පිළිබඳ වාර්තාමය වැඩසටහනක් සිදුකිරීම, කඩොලාන සහ ලවන ශාක පිළිබඳ වාර්තාමය වැඩසටහනක් සිදුකිරීම.
- වනදිවි තෙත්බිම් ප්‍රවෘත්ති පත්‍රය ප්‍රකාශයට පත්කිරීම

අභියෝග

- විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධ ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම
- ඉඩම් සම්බන්ධ ගැටළු විසදීමේ දී ඊට සම්බන්ධවන ආයතන (වන සංරක්ෂණ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි ) අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ දී මුහුණ දීමට සිදුවන ගැටළු
- විදුලි වැට උපකරණ ආනයනය කිරීමේදී අදාළ ආයතන වලින් සිදුවන ප්‍රමාදයන්
- වන සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා ගුණාත්මක භාවයෙන් යුතු ඖෂධ හා වෛද්‍ය උපකරණ දේශීය වෙළඳපල තුළ හිග වීම
- වෛද්‍ය උපකරණ ආනයනය කිරීමට සිදුවන නිසා අධික පිරිවැයක් දැරීමට සිදුවීම

ඉලක්ක

- වනජීවී සංරක්ෂණය කෙරෙහි ජනතාවගේ දැනුවත් භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම

**2.5 දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග**

| අ/අ | ඉදිරි ඉලක්ක | | අභියෝග |
|---|---|---|---|
| 1 | වනසත්ත්ව - මිනිස් ගැටුම් අවම කිරීම | 1. 2024.12.31 දින වන විට පවතින විදුලි වැට කි.මී. 5620.96 ක් නඩත්තු කර පවත්වාගෙන යාම.<br>2. නව විදුලි වැට කි.මී 807. 00 ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අදාල වනජීවී කලාප වලින් යෝජනා ඉදිරිපත් කර ඇත. | • විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා හේතුවෙන් ඉදි කිරීම් ප්‍රමාද වීම<br>• ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන විවධ ආයතන (වන සංරක්ෂණ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) සමඟ කටයුතු කිරිමේ දී සිදුවන ප්‍රමාද<br>• විදුලි වැට උපකරණ ආනයනය කිරීමේදී සිදුවන ප්‍රමාදයන්. |
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය නොවන වත්කම්**

(අ) පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය 2023 වර්ෂයේ අවසන්වීමේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද එකතුව රු.2,296,821,546 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළ අයිතම නිවැරදිව හඳුනාගෙන CIGAS වැඩසටහන මඟින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදුලි වැට උපකරණ සොරා ගැනීම් හා එම උපකරණවලට සිදුවී තිබූ හානි සඳහා වූ අලාභය රු.2,358,410 ක්, 2024 වර්ෂය තුළ පොත්වලින් කපා හැරීමට තීරණය කර හානි පාඩු ලේඛනයෙන් කපාහැර තිබුණද, එම වටිනාකම් ජංගම නොවන වත්කම්වල විදුලිවැට උපකරණවලින් ඉවත් කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.1,194,901,394 ක් හෙවත් සියයට 58 සිට සියයට 73 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද | රජයට අය විය යුතු මුදල් අයකර ගත යුතු ආකාරය දක්වා ඇතත් මියගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ඉක්ම වූ රු.506,059 ක ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570 සහ 571(2) | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ සියලුම තැන්පතු ඉකුත් තැන්පතු ලෙස සලකා රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වුවද,2025 මැයි 29 දිනට පැවති රු.13,070,700 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් එසේ කටයුතු නොකර තැන්පතු ගිණුම් 04 ක් තුළ පවත්වාගෙන ගොස් තිබූ අතර මේ තුළ ඇතුළත් රු.4,072,331 ක් වූ තැන්පතු වර්ෂ 05 ක් ඉක්මවා ගොස් තිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) වගන්තිය | අනුරාධපුර, නැගෙනහිර, වව්නියාව, ත්‍රිකුණාමලය සහ මධ්‍යම කලාප කාර්යාලයන්හි පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීමකින් තොරව අතිකාල හා නිවාඩු දින වැටුප් පිළිවෙලින් රු.13,506,093, රු.11,971,448, රු.1,845,650, රු.2,940,239 සහ රු.15,622,051 ක් වශයෙන් එකතුව රු.45,885,487 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.3.1 සහ 4.3.2 ඡේද | සියලුම සම්බන්ධිත පිරිවැය ඇතුළත් කරමින් මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවද රු.6,632,395 ක් වැයකර තිබූ 2024 වර්ෂයේ නිල ඇඳුම් උපාංග මිලදී ගැනීමේ කාර්යය සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි. |
| (ඊ) | 2024 දෙසැම්බර් 16 දිනැති අංක | අලාභයේ වටිනාකම සඳහන් නොවූ වාහන |

| | |
|---|---|
| 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 06 ඡේදය | අනතුරු 09 ක් හානි පාඩු ලේඛනය තුළ ඇතුළත් කර තිබුණද, ඒවා මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් ප්‍රකාශය ඇමුණුම 01 හි දක්වා නොතිබුණි. |

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **කාර්යභාරයන් ඉටු නොකිරීම**

ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.54,050,000 ක් වූ කාර්යයන් 63 ක් සම්බන්ධයෙන් කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

4.1.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.23,710,000 ක් වූ කාර්යයන් 62 ක භෞතික ප්‍රගතිය සියයට 3 සිට සියයට 30 අතර අවම මට්ටමක පැවතුණි.

4.1.3 **අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

(අ) මින්නේරිය වනෝද්‍යානය සහ එහි පරිසර පද්ධතිය හා ජීවීන් පිළිබඳ සංචාරකයන්ට අවබෝධයක් ලබාදීමේ අරමුණින් උද්‍යාන පිවිසුමේ තනා ඇති කෞතුකාගාරය නිසි නඩත්තුවක් හා නවීකරණයක් කර නොතිබීම නිසා අපවිත්‍ර වී තිබීමෙන් එම කෞතුකාගාරය ප්‍රදර්ශනය කිරීමට සුදුසු මට්ටමේ නොතිබුණි.

(ආ) කවුඩුල්ල වනෝද්‍යානය තුළ පිහිටි මැණික්සොරොව්ව සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු රු.3,555,313 ක වියදමකින් 2024 අප්‍රේල් මාසයේ නිම කර තිබුණද, 2025 අප්‍රේල් 04 දක්වා සංචාරකයන් සඳහා විවෘත කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පුහුණු සැසි පැවැත්වීම මූලික අරමුණ කර ගනිමින් ඉදිකර ඇති රිටිගල පුහුණු මධ්‍යස්ථානය තුළ 2024 වර්ෂයේදී පුහුණු සැසි 05 ක් පමණක් පවත්වා තිබුණි.

4.1.4 **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

හෝර්ටන් තැන්න ජාතික උද්‍යානයට අදාළව 2005 වර්ෂයේ පිළියෙල කර තිබූ කළමණාකරණ සැලැස්මේ ඇතුළත් ජාතික උද්‍යානයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රවේශපත්‍ර කවුළු පට්ටිපොළ දක්වා

පහළ ස්ථානයක් වෙත ගෙන ඒම, පැමිණෙන සංචාරකයින් සඳහා වඩාත් ගුණාත්මක සංචාරක පහසුකම් සැපයීම සඳහා විවේකී ස්ථාන ඇති කිරීම, දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් සඳහා යෝග්‍ය සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම, සංචාරකයින් සඳහා ආපනශාලාවක් ඇති කිරීම, සංචාරකයින් ගමන් ගන්නා මාර්ගවල සුදුසු ස්ථානයන්හි විවේක ගැනීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම යන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුවේ අරමුණු අතර රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් ඇති කළ යුතු වීම ඇතුළත්ව තිබුණ ද දෙපාර්තමේන්තුව සතු ජාතික උද්‍යානවල පැවති පහත සඳහන් අඩුපාඩු හේතුවෙන් එම අරමුණු ඉටු වී නොතිබුණි.

i. **හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය**

උද්‍යානය තුළ පවතින 'වන නිවහන' සංචාරක නිවාසය ඉතා අබලන් හා අපිරිසිදු තත්වයේ පවතින අතර සනීපාරක්ෂක පහසුකම් ද නොමැති වීම හේතුවෙන් 2023 හා 2024 වර්ෂවල මෙම සංචාරක නිවාසය වෙන් කිරීම මසකට දින 01 සිට දින 12 දක්වා ඉතා අවම මට්ටමක පැවතිණි. එමෙන්ම උද්‍යානය තුළ පිහිටි සේවක නිල නිවාස වසර ගණනාවක් තිස්සේ නිසි අළුත්වැඩියාවකට ලක් කර නොතිබීම නිසා වනජීවී නිලධාරීන් හට සිය රාජකාරී තෘප්තිමත් භාවයකින් සිදුකරගෙන යෑමට අපහසු වී තිබුණි.

ii. **හොරගොල්ල ජාතික උද්‍යානය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ 1992 හදිසි ඇමතුම් අංකයට ලැබෙන සත්ව අනතුරු සම්බන්ධ තොරතුරු මත පදනම්ව සතුන් මුදවා ගැනීම සහ සතුන්ට ප්‍රතිකාර කිරීම සිදු කරනු ලැබුව ද හොරගොල්ල ජාතික උද්‍යාන බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්හි පවතින කොටි මිනිස් ගැටුම හේතුවෙන් අනතුරට පත්වන කොටින් මුදවා ගැනීම සහ ප්‍රතිකාර කිරීමට අවශ්‍ය උපකරණ කාර්යාල සතුව නොතිබුණි.

iii. **මින්නේරිය හා කවුඩුල්ල ජාතික උද්‍යානය**

මින්නේරිය වන උද්‍යානය ආරම්භ වී වසර 27 ක් පමණ ගත වී තිබුණද, සංචාරකයින්ගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය සපයා දීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබූ අතර සනීපාරක්ෂක පහසුකම් ද ගුණාත්මක තත්වයේ නොපැවතුණි.

iv. **පරවි දූපත් ජාතික උද්‍යානය**

පරවි දූපත් ජාතික උද්‍යානය වෙත ප්‍රවේශ වීම සඳහා පවතින "A" කවුළුව මුහුදු ඛාදනය මගින් විනාශ වී තිබූ අතර තාවකාලික කන්ටේනර් පෙට්ටි කොටසක ස්ථාපනය කර තිබූ "B" කවුළුවද විධිමත් පරිදි නඩත්තු නොකිරීම නිසා මළ බැඳී විනාශ වෙමින් පැවතුණි. ප්‍රවේශ පත්‍ර කවුළුවේ වහලය ද කැඩී ගොස් අනතුරුදායක තත්ත්වයක පැවති අතර කිසිදු සනීපාරක්ෂක පහසුකමක් ද නොතිබුණි. එසේම උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගෙන් ප්‍රවේශ පත්‍ර ගාස්තුවක් අය කළද කිසිදු සංචාරක පහසුකමක් සපයා දී නොතිබුණි.

(ආ) මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් මින්නේරිය හා කවුඩුල්ල ජලාශ නිරන්තරයෙන් ජලය පිරී තිබීම නිසා වැව් පිට්වල තෘණ ආහාරයට ගැනීමට පැමිණෙන අලි ඇතුන් සඳහා ආහාර ප්‍රමාණවත් නොවීමෙන් වන අලින් ගම් වැදීමෙන් අලි මිනිස් ගැටුම උග්‍රවීම වැලැක්වීම හා සංචාරක කර්මාන්තය රැක ගැනීම වෙනුවෙන් මින්නේරිය සහ කවුඩුල්ල ජලාශවල ජල කළමනාකරණය සම්බන්ධ පාර්ශවයන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණද, 2024 ඔක්තෝබර් 31 දින වන විටත් එවැනි අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

5 **තිරසාර සංවර්ධනය**

5.1 **තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කරගැනීමට කටයුතු කරනු ලබන ආයතනයක් ලෙස එහි ඉලක්ක 10 හා 11 අනුව සැමට සමානාත්මතාවය ඇති කිරීම සඳහා කටයුතු කළ යුතු වුව ද ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි ආකාරයට උද්‍යාන තුළ හා ඉන් පිටත පහසුකම් සලසා නොතිබුණි.

6. **මානව සම්පත් කළමනාකරණය**

2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 41 ක් ඇතුළුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 1377 ක් විය. ආදායම් උත්පාදනය කරන දෙපාර්තමේන්තුවක් වශයෙන් හා දිවයින පුරා ව්‍යාප්තව පවතින කාර්යාල ජාලයකින් සමන්විත මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහාත් කළමනාකරණ

තීරණ ගැනීම සඳහාත් ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ තනතුරුවල පවත්නා පුරප්පාඩු අහිතකර ලෙස බලපෑ හැකිව තිබුණි.

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

**4. පරිච්ඡේදය**

**ආයතනයේ කාර්ය සාධන දර්ශක**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| ඉදිකළ විදුලි වැට දිග (කි.මී) | √ | - | - |
| නඩත්තු කළ විදුලි වැට දිග (කි.මී) | √ | - | - |
| අළුත්වැඩියා කරන ලද ජල ප්‍රභව (සංඛ්‍යාව) | √ | - | - |
| වාසස්ථාන සුපෝෂණය කළ බිම් ප්‍රමාණය (හෙ.) | √ | - | - |
| ස්ථාපිත කරන ලද දැන්වීම් පුවරු (සංඛ්‍යාව) | √ | - | - |
| අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි (සංඛ්‍යාව) | √ | - | - |
| අළුත්වැඩියා කරන ලද මාර්ගවල වල දුර (සංඛ්‍යාව) | √ | - | - |
| අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම් (සංඛ්‍යාව) | √ | - | - |
| අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා (සංඛ්‍යාව) | - | √ | - |
| වැඩිදියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් (සංඛ්‍යාව) | √ | - | - |
| වැඩි දියුණු කරන ලද ජල සැපයුම් පද්ධති (සංඛ්‍යාව) | √ | - | - |
| වැඩිදියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති (සංඛ්‍යාව) | √ | - | - |
| යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (සංඛ්‍යාව) | - | √ | - |
| ක්‍රියාත්මක කළ ජනවිඥුම්කරණ වැඩසටහන් (සංඛ්‍යාව) | √ | - | - |
| මිලදී ගන්නා ලද අලි වෙඩි (සංඛ්‍යාව) | √ | - | - |
| නිෂ්පාදනය කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව) | √ | - | - |
| සවි කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව) | √ | - | - |
| කෙටි කාලීන පුහුණු වැඩසටහන් (සංඛ්‍යාව) | √ | - | - |
| වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | √ | - | - |
| දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ (සංඛ්‍යාව) | √ | - | - |

## 5. පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

**හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු**

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය % | | |
|---|---|---|---|---|---|
| | | | 0-49 | 50-74 | 75-100 |
| 14. සාගර මුහුදු හා සාගර මූලාශ්‍ර හා සම්පත් තිරසාර සංවර්ධනය උදෙසා සංරක්ෂණය කරමින් තිරසාරව භාවිතා කිරීම | 14.2 සමුද්‍ර ජීවීන් සංරක්ෂණය | සමුද්‍ර සංරක්ෂණය උදෙසා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැඩමුළු | - | √ | - |
| | | අලුත්වැඩියා කරනලද කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන. | - | √ | - |
| 15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණ තිරසාර භාවිතය උදෙසා ප්‍රවර්ධනය වනාන්තර තිරසාර ලෙස කලමනාකරණය, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම, ජෛව විවිධත්වයට වන හානිය අවම කිරීම. | 15.1 ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම , පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | වනජීවී රක්ෂිත ප්‍රදේශවල ඉදිකරන ලද නව ගොඩනැගිලි සංඛ්‍යාව | - | √ | - |
| | | මිලදී ගන්නා ලද යන්ත්‍ර හා කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව | - | - | √ |
| | | වනජීවී රක්ෂිත ප්‍රදේශ මැණුම් කිරීම හා වෙන් කිරීම. | - | √ | - |
| | | අලුත්වැඩියා කරන ලද ගොඩනැගිලි, කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව | - | √ | - |
| | 1.51 වනජීවී සංරක්ෂණය උදෙසා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | වනජීවී සංරක්ෂණය උදෙසා පුහුණු කරන ලද දේශීය වැඩ සටහන් සංඛ්‍යාව | - | - | √ |
| | | බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | - | - | √ |
| | 15.1 රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය | ජාතික උද්‍යානවල වැඩිදියුණු කරන ලද මාර්ග පද්ධතිවල දුර ප්‍රමාණය(කි.මී.) | - | - | √ |
| | | සංවර්ධනය කරන ලද සනීපාරක්ෂක පහසුකම් සංඛ්‍යාව | - | - | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සංවර්ධනය කරන ලද ජල සැපයුම් පද්ධති හා සූර්යබල සැපයුම් පද්ධති සංඛ්‍යාව | - | - | √ |
| | 15.1/15.9/15.c. වනඅලි මිනිස් ගැටුම අවම කිරීම | අළුතින් ඉදිකරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.)<br>නඩත්තු කරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.)<br>නඩත්තු කරන ලද විදුලි වැට ආරක්ෂක කුටි සංඛ්‍යාව<br>මිලදී ගන්නාලද අලි වෙඩි ප්‍රමාණය<br>මිලදී ගන්නා ලද විදුලි වැට උපකරණ සංඛ්‍යාව<br>වැඩිදියුණු කරන ලද වනජීවී වාසස්ථාන සංඛ්‍යාව.<br>පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීම් හා අධ්‍යාපන වැඩ සටහන් සංඛ්‍යාව. | - | - | √ |
| | 15.7 වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත හා වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනසතුන් හා පැලෑටිවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ක්‍රියාත්මක කිරීම | නිකුත් කරන ලද CITES හා FFPO බලපත්‍ර සංඛ්‍යාව | - | - | √ |
| | 15.7 වනජීවී සංරක්ෂණය උදෙසා නූතන ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර පුහුණුව | දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව | - | - | √ |
| | 15.9 දේශීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය මාර්ග අවස්ථාවන් වැඩිකර ගැනීම | රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති සංඛ්‍යාව. | - | - | √ |

**තිරසර සංවර්ධන අභිමතාර්ථ 14 හා 15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග**

**ජයග්‍රහණ**

i. වනජීවීන්ගේ වාසස්ථාන සුපෝෂණ කටයුතු වැඩිකිරීම හා සංරක්ෂණයට පියවර ගැනීම
ii. අධ්‍යාපන හා ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් මඟින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීමට හැකිවීම.
iii. CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව හා CITES, RAMSAR වැනි අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මක කිරීම තුළින් ජාත්‍යන්තරය සමඟ කටයුතු කිරීම පහසුවීම.

**අභියෝග**

i. තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමට යාමේදී අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත්වල හිඟකම.
ii. රජය හා පෞද්ගලික අංශ මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්වභාවික හා ජෛව සම්පත්වල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජන ඇතිවීම.
iii. විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්න්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම.
iv. ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු
v. කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුළින් අපේක්ෂිත මට්ටමට ළඟාවීමට ඇති නොහැකියාව.

## පරිච්ඡේදය 06

### මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සේවා මට්ටම | අනුමත කාර්යය මණ්ඩලය | සේවයේ නියුතු කාර්යය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 88 | 48 | 41 |
| තෘතියික | 18 | 14 | 4 |
| ද්විතීයික | 1912 | 1104 | 809 |
| ප්‍රාථමික | 802 | 726 | 76 |
| එකතුව | 2820 | 1892 | 930 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයෙහි බලපෑම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් නිසි පරිදි ඉටුකිරීම සඳහා දැනට මෙම දෙපාර්තමේන්තුව සතු කාර්ය මණ්ඩලය ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් දිවයිනේ සෑම රාජකාරී ස්ථානයකටම නිලධාරීන් නිසි පරිදි අනුයුක්තකර ගත නොහැකි වීම මත දෙපාර්තමේන්තු අරමුණු ඵලදායීව ඉටුකර ගැනීම දුෂ්කර වී ඇත. ඉහතින් සඳහන් කරන ලද අරමුණු සඵලදායීව ඉටුකර ගැනීම සඳහා වර්තමාන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු ව්‍යුහය හා කාර්ය මණ්ඩල සංයුතියේ වෙනසක් සිදු නොකර සුදුසු ක්‍රමවේදයකින් පුරප්පාඩු පිරවීමට අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

මේ අතර බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පුහුණුව සඳහා අනුයුක්ත කර තිබූ බහුකාර්ය සංවර්ධන සහායකයින් අලි වැට නඩත්තු සහායක තනතුර සඳහා තනතුරු 4731 ක් දරන්නාට පෞද්ගලික වන සේ නැවත බඳවා නොගන්නා තනතුරක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට ස්ථිරවම බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත.

**6.3** මානව සම්පත් සංවර්ධනය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් වර්ග 2කි.

1. කෙටි කාලීන විශේෂ පුහුණු වැඩසටහන්
2. දිගු කාලීන නිත්‍ය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා පරාසය වැඩි කිරීමේ අරමුණ ඇතිව මෙම පුහුණු වැඩසටහන් පවත්වන අතර සෑම වැඩසටහනක් සඳහාම අදාල විෂය පථයන් සම්බන්ධව පුළුල් දැනුමැති සම්පත් දායකයන් සහභාගී කර ගනු ලැබේ.

| පුහුණු වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව / පිටපත් සංඛ්‍යාව | සමස්ත ආයෝජනය (රු.මි) | | වැඩසටහනේ කාලසීමාව | නිමැවුම (ලබාගත්දැනුම) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) |
|---|---|---|---|---|---|---|
| | | **දේශීය** | **විදේශීය** | | | |
| දිගු කාලීන පුහුණු වැඩසටහන් | | | | | | |
| ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර පාඨමාලාව | පුහුණු වැඩ සටහන් එකක් පවත්වා ඇත. | 7.6 | | මාස 21/2 | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ පුහුණුවක් ලබාදීම සහ නිලධාරීන්ගේ කුසලතා වර්ධනය. | |
| කණිෂ්ඨ සහතික පත්‍ර පාඨමාලාව | පුහුණු වැඩ සටහන් එකක් පවත්වා ඇත. | 9.0 | | මාස 21/2 | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ පුහුණුවක් ලබාදීම සහ නිලධාරීන්ගේ කුසලතා වර්ධනය. | |

| කෙටි කාලීන පුහුණු වැඩසටහන් | | | | | | |
|---|---|---|---|---|---|---|
| පුහුණු වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව / පිටපත් සංඛ්‍යාව | සමස්ත ආයෝජනය (රු.මි) | | වැඩසටහනේ කාලසීමාව | නිමැවුම (ලබාගත්දැනුම) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) |
| 1.කාර්යාල කළමනාකරණය ලිපිගොනුකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව | පුහුණු වැඩ සටහන් 14 ක් පවත්වා ඇත. | 3.7 | | දින 3 | කාර්යාලවල රාජකාරී කටයුතු ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍යය දැනුම ලබාදීම. | දේශීය |
| 2. දෙමළ භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පුහුණුව | පුහුණු වැඩසටහන් එකක් පවත්වා ඇත. | 0.85 | | දින12- දින 15 | නිලධාරීන්ට දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා දී අදාල සහතිකය ලබා ගැනීමට අවශ්‍යය කටයුතු සලසා දීම. | දේශීය |
| 3.සිංහල භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පුහුණුව | පුහුණු වැඩසටහන් එකක් පවත්වා ඇත. | 0.65 | | දින12- දින 15 | නිලධාරීන්ට සිංහල භාෂා ප්‍රවීණතාව ලබා දී අදාල සහතිකය ලබා ගැනීමට අවශ්‍යය කටයුතු සලසා දීම. | දේශීය |
| 4.විදුලි වැට සම්බන්ධව සහ වනජීවී සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ දැනුවත්කිරීමේ පුහුණු වඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් 3 ක් පවත්වා ඇත. | 0.14 | | දින 1 | ඉහළ කාර්යක්ෂමතාව යකින් නිලධාරින්ගේ සේවය ලබාගැනීම. | දේශීය |

| පුහුණු වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව / පිටපත් සංඛ්‍යාව | සමස්ත ආයෝජනය (රු.මි) | | වැඩසටහනේ කාලසීමාව | නිමැවුම (ලබාගත්දැනුම) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) |
|---|---|---|---|---|---|---|
| **5.**ITMIS පද්ධතියට දත්ත ඇතුලත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ කළාප කාර්යාල වල නිලධාරීන් පුහුණු කිරීම | පුහුණු වැඩසටහන 2 ක් පවත්වා ඇත. | 0.7 | | දින 3 | කලාප කාර්යාල වල වියදම් කටයුතු විධිමත්ව ඉටුකිරීමේ හැකියාව ප්‍රගුන කිරීම. | දේශීය |
| 6. සන්නිවේදන පද්ධති භාවිතය පිළිබඳ පුහුණුව | එක් පුහුණු වැඩසටහන ක් පවත්වා ඇත. | 0.6 | | දින 4 | සන්නිවේදන උපකරණ හා එම උපකරණ භාවිතය පිළිබඳ දැනුවත් භාවයක් ලබාදීම. | දේශීය |
| 7.මාළුන් හඳුනාගැනීම සහ සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත්කිරීමේ පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන් 5 ක් ලබාදී ඇත. | | | දින 4 | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මාළුන් හඳුනාගැනීම සහ සංරක්ෂණ කටයුතු පිළිබඳ පුහුණුවක් ලබාදීම. | දේශීය |
| 8.පර්යේෂණ ක්‍රමවේද සහ වනජීවී ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු පිළිබඳ පුහුණුව | පුහුණු වැඩ සටහන් 6ක් ලබාදී ඇත | .2.6 | | දින 3 | පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ නිසි අවබෝධයක් ලබා දීම | දේශීය |
| 9.ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා GIS භාවිතය පිළිබඳ පුහුණුව | පුහුණු වැඩ සටහන් 6 ක් පවත්වා ඇත. | 1.3 | | දින 3 | නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම | දේශීය |

| පුහුණු වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව / පිටපත් සංඛ්‍යාව | සමස්ත ආයෝජනය (රු.මි) | | වැඩසටහනේ කාලසීමාව | නිමැවුම (ලබාගත්දැනුම) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) |
|---|---|---|---|---|---|---|
| 10. ගිනි අවි භාවිතය පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම | පුහුණු වැඩ සටහන් 2 ක් පවත්වා ඇත. | 0.63 | | දින10 | නිලධාරීන්ගේ දැනුම යාවත් කාලීන කිරීම සහ එවුන්ගේ කුසලතා වර්ධනය කිරීම | දේශීය |
| 11. ආරක්ෂිත හා ඵලදායී ලෙස වන අලි මෙහෙයුම සිදුකිරීම පිළිබඳ පුහුණුව ලබාදීම | වැඩසටහන් 4 ක් පවත්වා ඇත | 0.38 | | දින 1 | කුසලතා ප්‍රවර්ධනය කිරීම හා දැනුම වර්ධනය කිරීම | දේශීය |
| 12. වන සතුන් මුදාගැනීමේදී ප්‍රථමාධාර ලබාදීම සිදුකරන ආකාරය පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම | වැඩසටහන් 2 ක් පවත්වා ඇත | 0.54 | | දින 3 | කුසලතා ප්‍රවර්ධනය කිරීම හා දැනුම වර්ධනය කිරීම | දේශීය |
| 13. නීතිය ක්‍රියාත්මක කිරීම හා උසාවි රාජකාරී කටයුතු පිළිබඳ පුහුණුව | වැඩසටහන් 2 ක් පවත්වා ඇත | 1.26 | | දින 5 | කුසලතා ප්‍රවර්ධනය කිරීම සහ දැනුම වර්ධනය කිරීම | දේශීය |
| 14. වන අලි - මිනිස් ගැටුම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන්ට පුහුණුවක් ලබාදීම සහ රාජ්‍ය නිලධාරීන් හා ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම | පුහුණු වැඩසටහන් 93 ක් කලාප 11 ක් ආවරනය වන පරිදි පවත්වා ඇත. | 1.5 | | එක් දින වැඩසටහන් | වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් සහ ජනතාව දැනුවත්කිරීම මගින් වඩාත් තිරසාරව වනජීවී සංරක්ෂයණ කටයුතු සිදු කිරීම . | දේශීය |

| පුහුණු වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව / පිටපත් සංඛ්‍යාව | සමස්ත ආයෝජනය (රු.මි) | | වැඩසටහනේ කාලසීමාව | නිමැවුම (ලබාගත්දැනුම) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) |
|---|---|---|---|---|---|---|
| 15. කොටි මිනිස් ගැටුම් කළමනාකරණය සඳහා ග්‍රාමීය ජනතාව සහ වතු කළමනාකාරීන් දැනුවත්කිරීමේ පුහුණු ලබාදීම. | පුහුණු වැඩසහන් 5 ක් පවත්වා ඇත | 0.57 | | එක් දින වැඩසටහන් | වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් සහ ජනතාව දැනුවත්කිරීම. | දේශීය |

එමෙන්ම නිලධාරීන් ගේ කුසලතා මගින් වනජීවී සංරක්ෂණ කටයුතුවලට අදාල සම්පත් දායකත්වය ලබාගැනීමේ අරමුණු ඇතිව කෙටි කාලීන පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ. එම පර්යේෂණ වල ප්‍රතිඵල වනජීවී සංරක්ෂණ හා කළමනාකරණ කටයුතු සඳහා දායක කරගැනීම සිදු වේ. 2024 වසරේ මුදල් ප්‍රතිපාදන යටතේ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් පර්යේෂණ 15 ක් සිදුකර ඇත.

එයට අමතරව රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ හෝ ඉන් පිටත පර්යේෂණ සිදුකිරීම සඳහා බාහිර ආයතනවලින් පැමිණෙන පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනා දෙපාර්තමේන්තු පර්යේෂණ කමිටුව වෙත යොමුකර එහි නිර්දේශය මත අවශ්‍ය අනුමැතිය ලබාදීම ද සිදු කරනු ලැබේ. මේ යටතේ පර්යේෂණ කමිටු 5 ක් පවත්වා ඇති අතර එහිදී කමිටු සමාජිකයන්ගේ නිර්දේශය මත බාහිර පර්යේෂකයන්ගේ පර්යේෂණ ව්‍යාපෘති 154 ක් සිදුකිරීම සඳහා අනුමැතිය දී ඇත.

වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා පාසැල් ළමුන් සහ රාජ්‍ය නිලධාරීන් ගේ සහයෝගය ලබාගැනීමේ අරමුණින් ලෝක තෙත් බිම් දිනය, ලෝක වනජීවී දිනය, ජෛව විවිධත්ව දිනය සහ ලෝක පරිසර දිනය සැමරීම සඳහා පාසල් සිසුන්ගේ සහභාගිත්වය ඇති විශේෂ දැනුවත්කිරීමේ වැඩසටහන් 6ක් පවත්වා ඇත.

ප්‍රචාරක වැඩසටහන්

| වැඩසටහන | ප්‍රචාරක වැඩමුළු අත්පත්‍රිකා /සංඛ්‍යාව | සමස්ත ආයෝජනය (රු.මි) | වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය) | නිමැවුම |
|---|---|---|---|---|
| වනජීවී සඟරාව මුද්‍රණය කිරීම | පිටපත් 1.11 | 1.03 | දේශීය | වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීම |
| ලෝක වනජීවී දිනය සැමරීම | පොදු 01 | 1.68 | දේශීය | |
| වනන්තරේ කතන්දරේ ගුවන්විදුලි වැඩසටහන | පටිගත කිරීම 2 | 0.021 | දේශීය | |
| වලසුන් පිළිබඳ රූපවාහිනී වැඩසටහන | පටිගත කිරීම් 01 | 0.031 | දේශීය | |
| මාධ්‍ය දැනුවත් කිරීම සහ පුහුණු වැඩමුළුව රන්දෙණිගල /යාල 06 | නිලධාරීන් දැනුවත් කිරීම | 0.0027 | දේශීය | |
| වනජීවී විත්ති ප්‍රවෘත්ති පත්‍රිකාව මුද්‍රණය කිරීම | ප්‍රකාශන 12 | 0.76 | දේශීය | |
| ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂින් අත්පොත මුද්‍රණය කිරීම | පිටපත් 5000 | 1.35 | දේශීය | |
| 2024 අලි සමීක්ෂණ පිළිබඳ වාර්තාමය වැඩසටහන සැකසීම | වැඩසටහන් 01 | 1510 | දේශීය | |
| ආනවිලුන්දා අභය භූමියේ වාර්තාමය වැඩසටහන | වාර්තාමය වැඩසටහන් 01 | 0.03 | දේශීය | |
| තෙත්බිම් දින වාර්තාමය වැඩසටහන සැකසීම | වාර්තාමය වැඩසහන් 1 | 0.012 | දේශීය | |
| Public Talk | වැඩ සටහන් 12 | 0.00 | දේශීය | |

**ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන ආකාරය**

1. ආයතනයේ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන්/ධාරිතා වර්ධන වැඩසටහන් හරහා දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමෙන් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
2. නව තාක්ෂණික ක්‍රමවේදයන් මානව සම්පත හරහා ආයතනයට අවශෝෂණය කරගැනීම තුළින් ආයතනික ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරගැනීමට හැකිවීම හා වඩා ඵලදායී සේවාවක් ලබාදීමට හැකිවීම.
3. ආයතනයේ විධායක හා කළමනාකරණ මට්ටම හා පහළ ශ්‍රේණිවල නිලධාරින් අතර මනා සන්නිවේදන ක්‍රමවේදයක් ඇතිකිරීම මඟින් ඔවුන් අතර සුහදතාවය වර්ධනය වන නිසා, ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට හැකිවීමෙන් ආයතනයේ ඵලදායිතාව ඉහළ නැංවීම.
4. ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතා වලින් හෙබි මානව සම්පත වර්ධනය කර ගත හැකිවීම.
5. වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා බාහිර පාර්ශ්වයන් සහභාගී කරගැනීමට දැනුවත් කිරීමේ වැඩ සටහන් උපකාරීවීම හා අලිමිනිස් ගැටුම කළමනාකරණය සඳහා ග්‍රාමීය ජනතාවගේ දායකත්වය ලබාගැනීමට හැකිවීම.

## පරිච්ඡේදය 07

### 7.1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | - | - |
| 1.6 | වෙනත් | | - | - |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | | CIGAS මෘදුකාංගය මගින් පවත්වාගෙන යනු ලැබේ. | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | ආයතනය තුල මූල්‍ය බලතල පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාරය මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | - | - |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල නොවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| **07** | **විගණන කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂයතුල පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම හා අපහරණයකිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම. | | කටයුතු කරමින් පවතී | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම. | | කටයුතු කරමින් පවතී | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | - | - |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | එවැනි ගිණුමක් නොමැත. | - | - |
| 9.2 | වාහන ගර්හිතවී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණයකර තිබීම. | අනුකූල වේ | | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙනයාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙලකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | පසුව ඉදිරිපත් කර ඇත | **-** |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | එවැනි ගිණුමක් නොමැත. | | **-** |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණයවූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම. | | **පසුව නිවැරදි කිරීම් කර ඇත.** | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | **-** |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | - | **-** |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණයශේෂ නිරවුල් කර තිබීම | | අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීනකර පවත්වාගෙනයාම. | අනුකූල වේ | - | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාවතුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙනයාම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛණයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාමෙ | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම. | අනුකූල නොවේ. | වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | - | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සෘජුවම සංචාරක බංගලා වෙන් කිරීම සම්බන්ධව පමණක් වුවද මෙයද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කරගත හැකි බැවින් පුරවැසි ප්‍රඥප්තියක් සැකසීමේ අවශ්‍යතාවයක් පැන නොනැඟේ. | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැළැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුල තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැළැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | **නිමි.** | | |